මගේ අංකය: GA/1/9/TR/2025

පාලන අංශය 01,

වාරිමාර්ග දෙපාර්තමේන්තුව,

බෞද්ධාලෝක මාවත,

කොළඹ 07.

2024.07.24

සියළුම අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)/ප්‍රධාන මූල්‍ය නිලධාරි,

**වාරිමාර්ග අධ්‍යක්ෂ/ අධ්‍යක්ෂ (යාන්ත්‍රික)/අධ්‍යක්ෂ (ITI-ගල්ගමුව)/ව්‍යාපෘති අධ්‍යක්ෂ,**

**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ,**

ප්‍රධාන ඉංජිනේරු/ ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු/ ප්‍රධාන නේවාසික ඉංජිනේරු,

ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු/වාරිමාර්ග ඉංජිනේරු/නේවාසික ඉංජිනේරු,

යාන්ත්‍රික ඉංජිනේරු/භූ සම්පත් ඉංජිනේරු.

<u>වාර්ෂික ස්ථාන මාරුවීම් 2025 - ඉංජිනේරු සහකාර සේවය</u>

2025.01.01 දින සිට ඉංජිනේරු සහකාර සේවයේ වාර්ෂික ස්ථාන මාරු කිරීම් සිදු කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන හා නොකරන සියළුම ඉංජිනේරු සහකාරවරුන් වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා වන ආදර්ශ අයදුම්පත්‍රය සම්පූර්ණ කර 2024.08.15 දින හෝ ඊට පෙර මා වෙත ලැබීමට සලස්වන මෙන් දැන්විය යුතුය.

02. මේ වන විට ස්ථාන මාරුවීම් නියෝග ලබා දී ඇති සහ එම ස්ථානමාරු සම්බන්ධයෙන් ලිඛිතව දීන දීර්ඝ කිරීමක් සිදු කර නොමැති සියළුම නිලධාරීන් මේ වන විට නව සේවා ස්ථාන සඳහා සේවයට වාර්තා කර තිබිය යුතුය.

03. **තම කාර්යාලයේ සියළුම ඉංජිනේරු සහකාරවරුන්ගේ අයදුම්පත් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරුන්/ නේවාසික ඉංජිනේරුවරුන් විසින් හැකි ඉක්මනින් තම දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ/ ව්‍යාපෘති අධ්‍යක්ෂ / නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ / ප්‍රධාන නේවාසික ඉංජිනේරු වෙත ලබා දීමටත්,** දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ / ව්‍යාපෘති අධ්‍යක්ෂ / ප්‍රධාන නේවාසික ඉංජිනේරු විසින් තමා යටතේ ඇති සියළුම කාර්යාලවල අයදුම්පත් තම නිර්දේශය සහිතව 2024.08.15 දිනට පෙර පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන එකම ආවරණ ලිපියක් මඟින් මා වෙත ලැබෙන්නට සැලැස්වීමටත් කටයුතු කල යුතුය.

04. එසේ අයදුම් නොකරන අය වෙතොත් ඔවුන් දෙපාර්තමේන්තු අවශ්‍යතාවය මත ස්ථාන මාරු කිරීමට සිදුවනු ඇති අතර පසුව ඔවුන්ගෙන් ලැබෙන අභියාචනා සලකා බලනු නොලැබේ.

05. 2025 වසරට යෝජිත වැඩසටහන් පදනම් කරගෙන ඒ ඒ ප්‍රාදේශීය කාර්යාලවලට අවශ්‍ය ඉංජිනේරු සහකාරවරුන්ගේ සංඛ්‍යාව වෙන් වෙන්ව නිශ්චිත වශයෙන් දන්වන මෙන් සියළුම දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂවරුන්ගෙන්, ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්ගෙන්, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ හා ප්‍රධාන නේවාසික ඉංජිනේරුවරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මෙම අවශ්‍යතාවය ඉටු නොකලහොත් නිලධාරීන්ගේ ඉල්ලීම මත ඇතැම් ස්ථාන වල නිලධාරි අතිරික්ත / ඌනතා ඇතිවීමට පුළුවන. එවැනි අවස්ථාවලදී ඉංජිනේරු සහකාරවරුන්

අවශ්‍යතාවය දක්වා කරනු ලබන ඉල්ලීම් සලකා බැලීම වර්ෂය අතරමැදදී දුෂ්කර වන බවද විශේෂයෙන් සටහන් කර ගන්නා මෙන් දන්වමි. මේ සම්බන්ධයෙන් පහත ආකෘතිපත්‍රය පරිදි විස්තර ඉදිරිපත් කළ යුතුය.

| කාර්යාලයේ නම | අනුමත ඉංජිනේරු සහකාරවරුන් සංඛ්‍යාව | වත්මන් ඉංජිනේරු සහකාරවරුන් සංඛ්‍යාව | අතිරික්ත/පුරප්පාඩු සංඛ්‍යාව | 2025 වර්ෂය සඳහා අවශ්‍ය ඉංජිනේරු සහකාරවරුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | | | |

**06. එක් එක් කොට්ඨාශයට අයත් අයදුම්පත් වෙන් වෙන් වශයෙන් අංක යොදා මේ සමඟ ඇති ආකෘතියට අනුව උපලේඛන ගත කර ඒකාබද්ධ ලේඛනයක් වශයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. අයදුම්පත් වල ඇති තොරතුරුවල නිරවද්‍යතාවය ගැන ඔබ සෑහීමකට පත් විය යුතුය.**

07. අමුණා ඇති අයදුම්පත්‍රයේ 10 වැනි ඡේදය ප්‍රකාර සේවයේ අවශ්‍යතාවය මත ස්ථාන මාරු සඳහා නිලධාරියා විසින් මාරු වී යාමට කැමති සේවා ස්ථාන තුනක් (03ක්) මනාපය මත සඳහන් කර නොමැත්තේ නම් ඔවුන් දිවයිනේ ඕනෑම ස්ථානයක සේවයට කැමැත්ත ප්‍රකාශ කළා සේ සලකා කටයුතු කරනු ලැබේ.

08. සියළුම ඉංජිනේරු සහකාරවරුන් වත්මන් සේවා ස්ථානයට ස්ථාන මාරු වී පැමිණි දිනය නිවැරදිව සඳහන් කර තිබිය යුතු අතර, ස්ථාන මාරු අයදුම්පත් මා වෙත ඉදිරිපත් කිරීමේදී මෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සියල්ලම ඉටු වී ඇති බවට වග බලා ගන්නා ලෙස විශේෂයෙන් දන්වමි.

09. උපලේඛන 1 සහ 2 හි දෘඩ පිටපත් අයදුම්පත් සමඟ සාමාන්‍ය තැපැල මඟින් එවීමටත්, මෘදු පිටපත irrigationunit01@gmail.com ලිපිනයට විද්‍යුත් තැපැල මඟින් යොමු කිරීමටත් කටයුතු කළ යුතුය.

10. දැනට ස්ථාන මාරුවීම් ලබා විවිධ හේතුන් මත ක්‍රියාත්මක වන දින ප්‍රමාද කරවා ගත් අයද අයදුම්පත් ඉදිරිපත් කල යුතු අතර, ඒ බව අයදුම්පත්‍රයේ 07 වන ඡේදයේ අවසානයට සඳහන් කළ යුතුය.

**11. වාර්ෂික ස්ථාන මාරුවීම් අයදුම්පත්‍රය, උපලේඛන 1 සහ 2 හි මෘදු පිටපත් වාරිමාර්ග දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි පළ කර ඇති අතර ඒ අනුව නිවැරදිව සකස් කරන ලද අයදුම්පත් මා වෙත යොමු කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.**

ආචාර්ය (ඉංජි.) කේ.වැලිගෙපොලගේ
අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (විමර්ශන, ක්‍රම සැලසුම් හා සැලසුම්)
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)

ආචාර්ය (ඉංජි) කේ. වැලිගෙපොලගේ
අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජන...
(විමර්ශන, ක්‍රම සැලසුම් හා සැල...
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

පිටපත -

01. ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස

02. ලේකම්, වාරිමාර්ග ඉංජිනේරු ඩිප්ලෝමාධාරින්ගේ සංගමය - කරු.දැ.ගැ.ස